# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 07/2016**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 ජුනි මස 03 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

## මූල්‍යාධිකාරී තනතුර සඳහා වන තේරීම් කමිටුව සංශෝධනය කිරීම

1982.04.06 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 166 හි 12 ඡේදයේ දක්වා ඇති මූල්‍යාධිකාරී තනතුර සඳහා වන තේරීම් කමිටුවේ සංයුතිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයෙහි පත් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් වන III පරිශිෂ්ටයෙහි 12වන ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා නො``මැති අවස්ථාවක දී මූල්‍යාධිකාරී තනතුර සඳහා වන තේරීම් කමිටුවක් පැවැත්වීම පිළිබඳව පැහැදිළි කිරීමක් සඳහා වූ විමසීමක් සළකා බැලූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, මූල්‍යාධිකාරී තනතුර සඳහා වන තේරීම් කමිටුවේ සංයුතිය (ඇ) උප-ඡේදයේ දි පහත පරිදි සංශෝධනය කිරීමට තීරණය කර ඇත;

අ) ප්‍රධාන විධායක නිලධාරියා සභාපතිවරයා වන්නේය

ආ) කොමිෂන් සභාව මඟින් පත් කරන ලද එක් සමාජිකයෙක්

ඇ) අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ හෝ විවෘත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ලේකම්වරයා;

විශ්වවිද්‍යාලයේ ස්ථිර ලේඛකාධිකාරිවරයෙකු නොමැති විට හෝ ලේඛකාධිකාරී තනතුර නොදරන නිලධාරියෙකු ලේඛකාධිකාරී තනතුරේ වැඩ බලන්නේ නම් / රාජකාරී ඉටු කරනු ලබන්නේ නම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෙනත් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයෙකු පත් කරනු ඇත.

ඈ) එක් අයෙකු ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකු වන පරිදි පාලන අධිකාරිය මඟින් පත් කර ගත් සාමාජිකයන් දෙදෙනෙක්;

එසේ පත් කර ගන්නා සමාජිකයන්ගෙන් අවම වශයෙන් එක් අයෙකු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ, පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ හෝ සහතික කළ හා සංස්ථාපිත ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු විය යුතු වන්නේය.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරිවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූපීසී/එච්ආර්/2/3/85

ටී /-